# කර්මාන්ත අමාත්‍යාංශය

## ලෝක ඇසුරුම් සංවිධානයේ අනුමත
## ඇසුරුම් තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පුහුණු පාඨමාලාව -2024

කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (Sri Lanka Institute of Packaging ) සමඟින් එක්ව ඇසුරුම් කර්මාන්තයේ නියුක්ත සේවකයින්ගේ කුසලතා සහ තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙහෙයවනු ලබන සති අන්ත පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඇසුරුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පහත සඳහන් සුදුසුකම් සහිත තාක්ෂණික මට්ටමේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස සමාගම් වලට ආරාධනා කරනු ලැබේ.

**සුදුසුකම් :**
අ. පො. ස (උ.පෙ.) සමත්වීම හෝ විද්‍යාව, කෘෂිකර්මය සහ ගණිතය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව සම්මාන 03 ක් සහිතව අ. පො. ස (සා.පෙ.) සමත්, ඇසුරුම් ක්ෂේත්‍රය රැකියාව ලෙස තෝරා ගැනීමට කැමති අයට අයදුම්කල හැකි වන අතර දැනට ඇසුරුම් ක්ෂේත්‍රයේ නියලී සිටින නිලධාරීන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දේ ( වසර 02 අවම සේවා පලපුරුද්ද ).කලමණාකරුවන්, විධායක නිලධාරින්, සුපර්වයිසර්වරුන්, තත්ව පාලන නිලධාරින්, මිලදිගැනිම් නිලධාරින්, අලෙවිකරණ නිලධාරින් සහ ඇසුරුම් කෙෂ්ත්‍රයේ සහ ඇසුරුම් භාවිතා කරන ආයතනයන් හී යන්ත්‍ර ක්‍රියාකරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**මාධ්‍යය:** ඉංග්‍රීසි සහ සිංහල

**පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය :**

ඇසුරුම් ක්ෂේත්‍රයේ පරමාර්ථ/ ඇසුරුම්කරණය හා ඵලදායිතාවය/ තත්ත්ව කළමනාකරණය සහිත ඇසුරුම්කරණය/ පොලිමර් තාක්ෂණය/ ඇසුරුම් පරීක්ෂාව/ ඇසුරුම් භාවිතය/ ඇසුරුම්කරණ ක්‍රියාවලිය/ ආර්ථික ඇසුරුම්කරණය/ ඇසුරුම් අලෙවිකරණය/ ඇසුරුම්කරණයේදී ඇතිවන පාරිසරික හා සෞඛ්‍ය බලපෑම/ ඇසුරුම් සම්බන්ධ ප්‍රමිතිකරණය/හරිත ඇසුරුම්කරණය/ තර්මෝ ප්ලාස්ටික් ක්‍රියාවලිය/ නම්‍යශීලි අසුරුම්කරණය/දෘඩ ඇසුරුම්කරණය/ කඩදාසි, කොරුගේටඩ්, ෆයිබර් ඇසුරුම්කරණය/ ලී පෙට්ටි, වීදුරු සහ ලෝහ ඇසුරුම්කරණය හා ඇසුරුම්කරණය පිළිබඳ කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා ද ඇතුලත් වේ.

**ස්ථානය :** **කොළඹ අවට පහසු ස්ථානයක දී**

කාල සීමාව: 2024 අගෝස්තු මස 03 දින සිට ( කර්මාන්ත නිරීක්ෂණ චාරිකාවන් 04 ද ඇතුලුව දින 14 ක් සෙනෙසුරාදා දිනයන් හිදී).

**පාඨමාලා ගාස්තු : රු. 120,000/- (එක් අයදුම්කරුවෙක් සඳහා)**

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SMEs) අපේක්ෂකයින්ට පුහුණු පාඨමාලාවේ මුළු පිරිවැයෙන් 50% ක් (පාඨමාලා ද්‍රව්‍ය ඇතුළුව) කර්මාන්ත අමාත්‍යාංශය විසින් මූල්‍ය ආධාර ලබා දෙනු ඇත. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත්, පිරිවැයෙන් 50% ක ඉතිරිය ඔවුන් විසින් දරන බවට සේවායෝජකයා අයදුම්පතෙහි සහතික කළ යුතුය. මහා පරිමාණ කර්මාන්ත අයදුම් කරුවන් පාඨමාලා සඳහා සහභාගි වන්නේ නම් මුළු පාඨමාලා ගාස්තුවම ගෙවිය යුතුය. (සහභාගිවන්නන්ගේ උපරිම සංඛ්‍යාව 25 කට සීමාවේ.)

**අයදුම්පත් :**
පහත සඳහන් QR කේතය හෝ ගුගල් දිගුව මගින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2024 ජූලි 15 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා:-
දුරකථන අංක 011-2422319/ ෆැක්ස් 011-2432750/ Email: sector1mid@yahoo.com/ Web: www.industry.gov.lk

**ලේකම්**
**කර්මාන්ත අමාත්‍යාංශය**
**73/1, ගාලු පාර, කොළඹ**

QR Code
Google link: https://shorturl.at/8wi05